සියලු ම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2022 (2023)

# 50 - නාට්‍ය හා රංග කලාව

ලකුණු දීමේ පටිපාටිය





මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත් වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතු ව ඇත.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2022 (2023)
க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2022 (2023)

විෂය අංකය / பாட இலக்கம் **50** ‍ ‍ විෂයය / பாடம் **නාට්‍ය හා රංග කලාව**

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 2 | 21. | 3 | 31. | 3 |
| 02. | 2 | 12. | 3 | 22. | 2 | 32. | 3 |
| 03. | 4 | 13. | 4 | 23. | 1 | 33. | 1,2 |
| 04. | 3 | 14. | 1 | 24. | 1 | 34. | 3 |
| 05. | 3 | 15. | 1 | 25. | 4 | 35. | 4 |
| 06. | 1 | 16. | 4 | 26. | 2 | 36. | 2 |
| 07. | 1 | 17. | 4 | 27. | 4 | 37. | 4 |
| 08. | 2 | 18. | 2 | 28. | 1 | 38. | 3 |
| 09. | 1 | 19. | 4 | 29. | 3 | 39. | 2 |
| 10. | 3 | 20. | 1 | 30. | 2 | 40. | 1 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: $\frac{25}{40}$

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: $\frac{25}{40}$

## 50 - නාට්‍ය හා රංග කලාව

## II පත්‍රය - පිළිතුරු

**1. දික්තල කාලගෝල නාට්‍යය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**(i) කාලගෝල කතා පුවත ඇතුළත් වන ජාතක කතාව කුමක් ද?**

**(ii) දික්තල කාලගෝල නාට්‍යයේ පසුබිම් සංගීතය සඳහා භාවිත කරන සංගීත භාණ්ඩ දෙකක් නම් කරන්න.**

**(iii) පොතේගුරු විසින් නාට්‍යය ආරම්භයේ දී හා අවසානයේ දී ඉදිරිපත් කරනු ලබන ගායන අංග දෙක කුමක් ද?**

**(iv) මෙම නාට්‍යයේ සංවාදවල සඳහන් වන ජාතක කතාව සහ රජ්ජුරුවන් ගේ නම කුමක් ද?**

**(v) මහෞෂධ පඬිතුමා පවසන ආකාරයට නීති මාර්ගයෙන් ලබාගත නොහැක්කේ කුමක් ද?**

**(vi) දික්පිටියා ගේ චරිතයෙන් ප්‍රකට වන අයහපත් ගතිලක්ෂණ දෙකක් සඳහන් කරන්න.**

I. උම්මග්ග ජාතකය *(ලකුණු 02යි)*

II. මද්දල, සර්පිනාව, බටනලාව, වයලීනය
*(දෙකක් නම් කර ඇත්නම් ලකුණු 02යි)*

III. මංගලම් ගීතය, පූර්ණ විරිදුව *(ලකුණු 02යි)*

IV. කුස ජාතකය, කුස රජ්ජුරුවෝ *(ලකුණු 02යි)*

V. ස්ත්‍රියකගේ ආලය *(ලකුණු 02යි)*

VI. බොරු කීම, අනුන් රැවටීම, වංචා කිරීම, කපටිකම් කිරීම,අවස්ථාවාදී වීම
*(මෙවැනි කරුණු දෙකක් ලියා ඇත්නම් ලකුණු 02යි)*

**2. (i) 'රංග ක්‍රීඩා' යනු කුමක් දැ යි හඳුන්වන්න.**

**(ii) රංග ක්‍රීඩා හතරක් නම් කරන්න.**

**(iii) ඉහත (ii) හි සඳහන් රංග ක්‍රීඩා මගින් ආධුනික රූපණ ශිල්පීන්ට ලැබෙන ප්‍රයෝජන මොනවා දැ යි පැහැදිලි කරන්න.**

I. රංග ක්‍රීඩා යනු රඟපෑම සඳහා සූදානම් කිරීමට සහ පුහුණු කිරීමට උපයෝගී කර ගන්නා ක්‍රීඩා ය.
*(ලකුණු 02යි)*

II. මීයා පූසා සෙල්ලම
අංක ක්‍රීඩාව
එළුවන් කෑම
වලිගය කැඩීම
මීයෝ මීමෝ
ඝාතකයා සෙවීම
නායකයා සෙවීම
පෙරළුණු ඔරුව
ගස් පැනීම
ගස් දෙකේ යුද්ධය
බෝලය පාස් කිරීම
බල්ලා සහ මස් කට්ට
මකර වලිගය
මෝරා සහ දූපත්
රාස්සයෙක් ගමට ඇවිත්

*(හතරක් නම් කර ඇත්නම් ලකුණු 04යි)*

CamScanner

III.

- ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව දියුණු කර ගත හැකි වීම
- ක්ෂණිකව ක්‍රියාත්මක වීමට යොමු වීම
- සාමූහිකව ක්‍රියා කිරීමට ඉගෙන ගැනීම
- විවිධ චලන ඉරියව් ප්‍රගුණ කිරීමට ඉගෙනීම
- අවධානය යොමු කිරීමට පුහුණු වීම
- හොඳින් සිතන්නට හොඳින් අසන්නට පුහුණුවක් ලැබීම
- ක්‍රියාවට ප්‍රතික්‍රියා දැක්වීමට ඉගෙන ගැනීම
- අවකාශයේ සීමා හඳුනා ගැනීම හා එකී අවකාශය තුළ හැසිරීමට ඉගෙන ගැනීම
- සබකෝලය අඩු කර ගැනීමට උපකාරී වීම
- සිරුරේ නම්‍යශීලී බව වර්ධනය වීම
- කායික හා මානසික ශික්ෂණයක් ඇති කිරීම

***(2 II පිළිතුරෙහි සඳහන් රංග ක්‍රීඩාවලට අදාළ කරුණු 03 ක් විස්තර කර ඇත්නම් ලකුණු 06යි)***

**3. (i) 'අංග රචනය' යනු කුමක් ද යි හඳුන්වන්න.**
**(ii) අංග රචනය සඳහා භාවිත කරන ද්‍රව්‍ය සහ උපකරණ හතරක් නම් කරන්න.**
**(iii) වේදිකා නාට්‍යවල චරිත නිරූපණය සඳහා අංග රචනය අවශ්‍ය වන්නේ කවර හෙයින් ද යන්න කරුණු තුනක් යටතේ නිදසුන් සහිත ව පෙන්වාදෙන්න.**

I. අංග රචනය යනු වර්ණ ආලේප කිරීමෙන් හෝ වෙනත් ද්‍රව්‍ය යොදාගෙන චරිතයකට අවශ්‍ය පරිදි නළු නිළියන්ගේ මුහුණුවල සහ සිරුරේ සම මත සිදු කරනු ලබන වෙනස්කම් ය.

***(ලකුණු 02යි)***

II. පදනම් ආලේප (පෑන් කේක්, ග්‍රීස් පේන්ට්) ලිප්ස්ටික්, රූජ්, ලයිනින් කලර්ස්, මේකප් පෙන්සිල්ස්, වූත් එනමල්, බ්‍රෂ්, ස්පොන්ජ්, පවුඩර් පෆ්, නෝස් පොටි, විග්ස්, ක්‍රේප් හෙයාර්, ස්ප්‍රිට් ගම්, කතුර, පනාව, හෙයා ස්ප්‍රේ, හෙයාර් ඩ්‍රයර්, ටිෂූ, හෙයාර් ජෙල්

***(ද්‍රව්‍ය හෝ උපකරණ 4ක් නම් කර ඇත්නම් ලකුණු 04යි)***

III.

- නාට්‍යයේ ශෛලීය අවබෝධ කර ගැනීමට
- නාට්‍යයේ නිරූපිත කාලය, දේශය, යුගය,හඳුනා ගැනීම
- චරිතයේ අභ්‍යන්තර ගති ලක්ෂණ පෙන්වීමට
- මුහුණේ ත්‍රිමානරූපී බව මතු කිරීමට
- සාත්වික අභිනය තීව්‍ර කිරීමට
- නළුවාගේ සමාරෝප කාර්යය පහසු කිරීමට

***( කරුණු 03 ක් නිදසුන් සහිතව විස්තර කිරීම සඳහා ලකුණු 06 යි)***

CamScanner

**4.** (i) පහත රට සම්ප්‍රදායට අයත් ශාන්තිකර්ම **දෙකක්** නම් කරන්න.
(ii) ඉහත (i) හි නම් කළ ශාන්තිකර්මවල අන්තර්ගත නාට්‍යමය පෙළපාලි **හතරක්** සඳහන් කරන්න.
(iii) ඉහත (ii) හි සඳහන් කළ නාට්‍යමය පෙළපාලියක දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ මොනවා දැ යි විමසාබලන්න.

I.

- සන්නි යකුම / දහඅට සන්නිය, රට යකුම / රිද්ද යාගය, සූනියම් යාගය, මහසොහොන් සමයම,ගම්මඩුව, දෙවොල් මඩුව

***(මෙකී ශාන්ති කර්ම නම් කිරීමට ලකුණු 02යි)***

II.

- සන්නි යකුම - කළු යකාගේ රංගාවතීර්ණය, රිරි යකාගේ රංගාවතීර්ණය, සූනියම් යක්ෂිණියගේ අවතාර තුන, තැඹිලි, කලස්, කළු, අඟුරු, දුම්මල,පාලි, සන්නි යකුන් (වෙඩි, වැදි), මහකෝල සන්නිය
- රටයකුම - නානු මුරය / දොළහ පෙළපාලිය, කපු යක්කාරිය, දරු නැළවිල්ල
- සූනියම් යාගය - වඩිග පටුන
- ගම්මඩුව - අඹ විදමන, මරා ඉපැද්දීම, රාම මැරීම, ඇත් බන්ධනය, මී බන්ධනය
- දෙවොල් මඩුව - දෙවොල් ගොඩ බැසීම, ගරා නැටීම

***(මෙවැනි නාට්‍යමය පෙළපාලි 4ක් සඳහන් කිරීම සඳහා ලකුණු 04යි)***

III.

- උපත් කතාවක් හෝ අතීත සිද්ධියක් ප්‍රතිනිර්මාණය කොට රඟ දැක්වීම, ඒ සඳහා සංවාද , අනුකරණය , අනුරූපණය, භාවිත කිරීම
- අවස්ථා නිරූපණයට ආංගික හා වාචික අභිනය යොදා ගැනීම
- චරිත නිරූපණයට වෙස් වළා ගැනීම
- බාහිර සමාජරෝපය සඳහා වෙස් මුහුණු පැළඳීම
- කඩුව, මුගුර, පොල්ල, වැනි රංග භාණ්ඩ යොදා ගැනීම

***(මෙවැනි නාට්‍යමය ලක්ෂණ තුනක් විස්තර කර ඇත්නම් ලකුණු 06යි)***


CamScanner

**5. (i) කෝලම් රංග භූමියක රූප සටහනක් ඇඳ එහි කොටස් නම් කරන්න.**

**(ii) කෝලම් උපත් කතාව විස්තර කරන්න.**

**(iii) සාම්ප්‍රදායික කෝලම් රැඟුමක දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ මොනවා දැ යි පෙන්වාදෙන්න.**

05. (i)




***(ලකුණු 02 යි)***

II.

- ***කෝලම් උපත් කතාව***

මහා සම්මත රජුගේ බිසවට කෙළි කවට සිනා සහිත නැටුම් බැලීමට දොළදුකක් උපදියි. එම දොළදුක රටේ කිසිදු නැට්ටුවෙකුට සංසිඳුවීමට නොහැකි වේ.
ඒ ගැන සිතමින් දුක්වන රජතුමා දැක ශක්‍රයාගේ පඬුපුල් ආසනය රත්වෙයි. ශක්‍රයා මැදිහත් වී කෝලම් මුහුණු හා ඒවා නටවන ආකාරය සඳහන් වූ පොතක් රජුගේ මඟුල් උයනේ තබයි. නළුවෝ මෙකී වෙස් මුහුණු පැළඳ නටා බිසවගේ දොළදුක සන්සිඳුවති.

***(ලකුණු 4 යි)***

III.

- පූර්ව රංගයකින් සහ අපර රංගයකින් සමන්විත වීම
  - ➢ මිනිස් චරිත (අණබෙර,නොංචි, පොලිස්, ආරච්චිල, මුදලි, ජස)
  - ➢ සත්ත්ව චරිත (සිංහ,කොටි වලස්, ගොන්)
  - ➢ රාක්ෂ චරිත (නාග ගුරුළු) සහ කාල්පනික චරිත
  
  යනාදි වශයෙන් චරිත රාශියක් අන්තර්ගත වීම
- සබේ විදානෙ හා සභාපති හැර අනිත් සියලුම චරිත වෙස් මුහුණු පැළඳ රංගනයේ යෙදීම
- සංගීතය සඳහා යක් බෙරය හා හොරණෑව භාවිත කිරීම
- එළිමහන් විවෘත කවාකාර භූමියක් රඟ මඩල ලෙස යොදා ගැනීම
- රාත්‍රී කාලයේ රඟ දැක්වීම
- සියලුම චරිත පිරිමින් විසින් රඟ දැක්වීම
- බෙර පදයකට අනුව ගමන් තාලයෙන් චරිත සබයට පිවිසීම හා පිටව යාම
- සබේ විදානේ එක් එක් චරිත කවි ගායනයෙන් හඳුන්වා දීම හා එකී චරිත සමග සංවාදයේ යෙදීම
- දෙබස් හාස්‍යජනක අයුරින් ඉදිරිපත් කිරීම
- එක් එක් චරිතවලට ආවේණික වෙස් ගැන්වීම් දක්නට ලැබීම
- කඩු, පොලු, තල් අත්ත, බෙරය වැනි රංග භාණ්ඩ භාවිත කිරීම
- රාස්ස නැටුම් හා සත්ත්ව නැටුම් ඇතුළත් වීම
- විවිධ කතාන්දර (මනමේ, සඳකිඳුරු, ගෝඨයිම්බර, කාල ගෝල,කුණ්ඩල කේශි, ගොං කොටි කතාව රඟ දැක්වීම)

***(කරුණු 06 ක් [illegible]***

6. (i) ආර්.ආර්. සමරකෝන් විසින් රචනා කොට අධ්‍යක්ෂණය කරන ලද නාට්‍ය **දෙකක්** නම් කරන්න

(ii) ඔබ නම් කළ නාට්‍ය නිර්මාණවල දිස් වන ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.

(iii) සිංහල නාට්‍ය කලාවේ ප්‍රගමනයට ආර්.ආර්. සමරකෝන් ගෙන් සිදු වූ සේවය ඇගයීමට ලක් කරන්න.

I.

- ලෙඩක් නැති ලෙඩෙක් (1968)
- අහසින් වැටුණු මිනිස්සු (1970)
- ඉඩම (1974)
- කැළණි පාලම (1978)
- ජේලර් උන්නැහේ (1986)
- දූවිලි (1990)
- රජ කතාව (1994)
- කපුටු බෝ (2004)
- කකුල් හතරේ ඉලන්දාරියා (2008)

*( නාට්‍ය දෙකක් නම් කර ඇත්නම් ලකුණු 02)*

II.

- ලෝක ධර්මී ශෛලියට අනුව නාට්‍ය රචනා කිරීම
- කවි,ගීතවලින් තොරව සංවාද පමණක් ඇතුළත් කොට පෙළ රචනා කිරීම
- ජීවන අරගලය, නිවාස ප්‍රශ්න,ඉඩම් අයිතිය වැනි කාලීන සමාජ ප්‍රශ්න තේමා කර ගැනීම
- කතා පුවත්වල සමාජයේ පහළ පන්තියේ හා මධ්‍යම පන්තියේ චරිත ඇතුළත් වීම
- සංවාද සඳහා ප්‍රාණවත් රසවත් බස් වහරක් යොදා ගැනීම
- ප්‍රබල ගැටුම් මගින් නාට්‍යෝචිත අවස්ථා මැවීම

*(කරුණු හතරක් සඳහා ලකුණු 04යි)*

III.

- තාත්වික ගණයේ ස්වතන්ත්‍ර නාට්‍ය 11ක් පමණ රචනා කොට නිෂ්පාදනය කිරීම
- අහසින් වැටුණු මිනිස්සු, කැළණි පාලම වැනි ජනප්‍රිය නාට්‍ය වසර 50කට ආසන්න කාලයක් දිවයිනේ විවිධ පළාත්වල රඟ දැක්වීම
- සමකාලීන සමාජ යථාර්ථය නාට්‍ය මගින් නිරූපණය කිරීම
- නාට්‍ය මගින් බහුතර ප්‍රේක්ෂක ජනයාට නොම ද ආස්වාදයක් ලබා දීම
- දක්ෂ නළු නිළියන් රැසක් වේදිකා රංගනයට හඳුන්වා දීම
- නාට්‍ය කලාව සාමාන්‍ය ජනතාව අතර ජනප්‍රිය කරවීම
- නිර්ධන පන්තියේ ජීවන අරගලය වේදිකාව මත නිරූපණය කිරීම

*(මෙවැනි කරුණු තුනක් විස්තර කොට ඇත්නම් ලකුණු 06යි.)*

Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more! CamScanner

7. පහත දැක්වෙන කථා සාරාංශය පදනම් කරගෙන ඒකාංක නාට්‍යයක් රචනා කරන්න. පැය කිහිපයක් තුළ සිදුවන සිද්ධීන් එක ස්ථානයකට සීමා වන සේ නාට්‍ය වස්තුව සකස් කළ යුතු ය.

කමල් සාමාන්‍ය පෙළ විභාගය විශිෂ්ට ලෙස සමත්වීම නිසා මව කමල්ට ස්මාර්ට් ජංගම දූරකථනයක් තෑගි කරයි. මෙය දකින කමල්ගේ නංගි තමාට ද ජංගම දූරකථනයක් අවශ්‍ය බව පවසයි. දරුවන්ට ජංගම දූරකථන ලබාදීම පිළිබඳ ව පියා තදින් ම විරුද්ධ වෙයි. පැරණි අදහස් ගරු කරන සීයා මෙම ප්‍රශ්නයට මැදිහත් වෙයි.

(i) පසුබිම, කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කිරීම සඳහා
(ii) චරිත අතර ගැටුමක් ඇති වන අයුරින් අවස්ථාව ගොඩනැගීම සඳහා
(iii) කුතුහලය දනවන නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා

I. පසුබිම කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කිරීම සඳහා

*(ලකුණු 04)*

II. චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් අවස්ථාව ගොඩ නැගීම සඳහා

*(ලකුණු 04)*

III. නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා

*(ලකුණු 04)*

PAST PAPERS WIKI



CamScanner

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න






කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

## සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න